# 05 ලද දෙව්දුවගේ වත

**සිංහල සාහිත්‍යයේ දඹදෙණි යුගයට අයත් සද්ධර්මරත්නාවලිය ලියා ඇත්තේ ධර්මසේන හිමියන් විසිනි. මේ ග්‍රන්ථය ශ්‍රද්ධාව දියුණු කරන අතර ධර්මාවබෝධය මෙන් ම ජීවිතාවබෝධය ද ලබා දෙයි.**

ආයු බොහෝ වූ මහසුප් මහ තෙරුන් වහන්සේ රජගහා නුවර ගාවා පුළිල ලෙණ වසන සේක් නිරෝධ සමාපත්තියට සමවැද සත් දවසක් නිරාහාර ව වැඩහිඳලා සත්වන දවස් බත් නො ලැබීම යුක්ත නො වන හෙයින් හා යම් කෙනෙක් තමන්වහන්සේට යමක් දුන්නු නම් උන් මහාසම්පත් ලබන හෙයින් බතක් දී ලන්ට නිසි කෙනෙකුන් දිවසින් බලන සේක් එක් හැල් සේනක් රක්නා ගෑනියක හැල්කරල් කඩාගෙන වී හැරගෙන විළඳ බදනා නියාව දැක සිඟා ගිය කල දී ලන්ට නිසි සැදෑ ඇත්තෝ දෝ හෝයි විමසා සැදෑ ඇති නියාවත් දන 'මට සංග්‍රහ කටහේ දෝ නොහේ දෝ 'යි විමසා 'ඒ කුල දූ තොමෝ මට සංග්‍රහ කෙරෙයි. සංග්‍රහයක් කොට මෙම ජාතියෙහි සම්පත් ලබන්ට ආයු ශක්තිය නැතත් දෙ වන ජාතියෙහි බොහෝ සම්පතුත් ලබන්නීය ' යි දැන ගැටවටු ගන්වා සිවුරු වැළඳ ගෙන පාත්‍රය පටවා ගෙන හැල් සේන බඩ සිටි සේක.

කුල දුවණියෝ ද මහතෙරුන් වහන්සේ දක පහන් සිතැති ව පස්වනක් ප්‍රීතීන් පිනා ගොසින් 'වැඩසිටිනේ යහපතැ' යි කියාලා විළඳ හැරගෙන වහා අවුත් මහතෙරුන් වහන්සේට පිළිගන්වා ලා පසඟ පිහිටුවා ලා වැඳගෙන 'ස්වාමීනි, මේ විළඳ ඇට බැදී සැහැල්ලු වූවා සේ ම කෙලෙස් බරින් සැහැල්ලු ව නිවන් දකිම්ව'යි පතාගත්හ. මහ තෙරුන් වහන්සේ ද 'දනමය කුශලය තොපට සිද්ධ වූවා සේ ම භාවනාමය කුසලයත් සිද්ධ වේවා' යි වදරා අනුමෙවෙනි බණ වදළ සේක.

උයිත් මහ තෙරුන් වහන්සේ වැඳගෙන තමන් දුන් දන් සලකමින් පූර්ව චේතනා මධ්‍ය චේතනා සේ ම අපර චේතනාත් ශුද්ධ කොටගෙන රැඳුණුවූ ය. ඒ සේනෙත් යන එන මඟ එක් බිලයෙක නයෙක් ඇත. ඒ මහ තෙරුන්වහන්සේගේ සිවුරෙන් වැසී තුබූ කෙණ්ඩ මැඩපිය නො හිණ. කුල දුවණියෝ ද තමන් දුන් දන් සලකමින් එතැනට පැමිණියහ. සර්පයා ද බිලයෙන් නික්ම දුන් දන අනුහසින් දෙව් සැප උදව්කොට ලබ්බවන්ට කරන්නාක් මෙන් දෂ්ට කොට එතන ම හෙළාපී ය. උෟ ද විෂ වේගයෙන් අනාථාත්‍වයකට නොපැමිණ පහන් සිතින් මියගොසින් තව්තිසා දෙව්ලොව එක් සිය විසි ගවුවක් පමණ රන්විමනෙක නිද පුබුද් කෙනෙකුන් මෙන් සව්බරණින් සැදුණු තුන්ගවුවක් පමණ දිව අත් බවකින් යුක්ත ව දේවතා දූ ව උපන්හ. උෟ තුමූ අටසාලිස් ගවුවක් පමණ දිග ඇති හකුළුවා ලූ කලට තුඹ මලක් සා හෝ පොටා මලක් සා මහත ඇති සළුවක් හැඳ එසේ ම සළුවක් පෙරව දහසක්

පමණ දෙවඟනන් පිරිවරා පූර්ව ජාතියෙහි කළ කුශලය හඟවනු නියා රන් විළඳින් පුරා මුතු සාළුවල තබන ලද රන් තැටිවලින් හොබනා විමන් දෙරකඩ සිට තමන්ගේ දිව සැපත් බලාපියා 'කුමන පිණක් කොට මේ සැපත් ලදිම් දෝහෝ 'යි දිවසින් බලන්නෝ මහසුප් මහ තෙරුන් වහන්සේට දුන්නා වූ විළඳෙහි අනුහසින් දිව සැපත් ලත් නියාවත් දිවස් ඇති තැනට දුන් හෙයින් දිවස් ලත් නියාවත් දැන 'ලසු කුශලයෙන් මෙසා මහත් සම්පතක් ලදින් මේ දෙව්ලොව තුන්කෙළ සැටලක්ෂයක් හවුරුදු පමණ නොව සසර ඉතා දික් ව තිබෙන හෙයින් පමා වීම නපුර මහසුප් ස්වාමීන්ට වත්පිළිවෙත් කිරීම නම් ලසු පින්කමක් නො වන හෙයින් බැරෑරුම් වූ ඒ පින්කම කොට උගත් ග්‍රන්ථයක් ප්‍රගුණකොට තරකරන්නා සේ තවත් තවත් පින් කිරීමෙන් සම්පත් තරකෙරෙමී' සිතා  උදෑසන ම දෝ නොහොත් පාන්දර ම මවාගන්නා දේ හෙයින් රන් මුස්නක් ද කසළගොටුවක් ද ගෙනවුත් මහ තෙරුන් වහන්සේගේ වෙහෙරමළු හැමද පියා කසළත් දමාපියා නහන පැන් බොන පැන් පෙරහා තබා ලූ ය. මහතෙරුන් වහන්සේ ඒ හැම දැක වත් පිළිවෙත් සරු කෙනෙකුන් වේලා පස ම  අවුත් වත් සපයා ලා ගිය නියාය යි ආවර්ජනා නො කළ හෙයින් සිතූ සේක. දේවතා දුවණියෝ දෙ වන දවසුත් වත්පිළිවෙත් එලෙස ම කළහ. මහ තෙරුන්වහන්සේත් ආදි ද සිතූ ලෙස ම සිතූ සේක. තුන්වන දවස් මහ තෙරුන් වහන්සේ උන් හමදනා හඬත් අසා කෙසිවිත් ආදියෙන් ඇතුළු ගෙට වන් ශරීරාලෝක දැක දෙර වැරලා 'හමදනේ කවුරු දැයි විචාළ සේක. 'ස්වාමීනි ,මුඹ වහන්සේට උවැසි ව සිටි ලද දෙව් දූ නම් මමය'යි කිවූ ය. 'අපගේ එනම් උවැසිකෙනෙක් ඇත්ද'යි විචාළ සේක.



'මම ස්වාමීනි, මීට පෙරාතු ජාතියෙහි හැල් සේනක් රක්නෙම් කන්ට බැදගෙන හුන් විළඳ සුඟක් තමා සුඟ වුවත් බොහෝ දවසකට වුවමනා වේ දැයි මුඹ වහන්සේට දන් දීලා සිත පහදවාගෙන නැවත එන්නෙම් "තොප කළ පින් රැකවල්පළට වදනා තරම් ද ? දෙව්ලොව

රන් විමන්වලට එව"යි කැඳවා ආ මේවර කරන්නකු වැනි නයකු අත මිය තවුතිසා දෙව්ලොව උපනිමි. ස්වාමිනි, මේ සම්පත මුඹ වහන්සේ නිසා ලදිමි. දනුත් මුඹ වහන්සේට වත්පිළිවෙත් කොට සම්පත් තරකරන්ට සිතා අයිමි' කිවූ ය.

'ආදි දෙදවසුත් වත්පිළිවෙත් කොළෝ තොපි ද'යි විචාරා 'එසේ ය, ස්වාමිනි 'යි කී කල්හි 'දේවතා දුවණියෙනි, තොප කළ වත් පිළිවෙත් කෙළේ ය. මෙවක් පටන් එබන්දක් නොකරව'යි වදළ සේක. 'ස්වාමිනි, එසේ නොවදළ මැනව. මුඹ වහන්සේ වැනි පින්කෙතක් ලබන්නට බැරි වුව සිද්ධ වන කුශලයත් ලසු නොවත් , ලසු නොවන කුශලයෙන් ලබන සම්පතුත් ලසු නොවත් මා ලබන වැඩියුරු සම්පතට හානි නොකොට වදළ මැනව'යි කිවූ ය. ඔබ ඒ අසා 'දේවතාදුව , සම්පත් තර කරන උපදෙස් මේ විනා නැද්ද ? නස්නා සම්පත් කෙසේ තර කරන්ට සිතයි නමුත් ඒ තර නො වෙයි. තර නම් නොනස්නා බැවින් නිවන. නිවන් පතා අතික් කරන යම් පිනක් කරව. මතු එන දවස විජිනිපත්‍ර හැරගෙන ධර්මාසනවල වැඩහිඳ බණ කියන්නවුන් ලවා "බුදුන් සමයෙහි මහසුප් තෙරුන් වහන්සේට එක් දෙව් දුවණි කෙනෙක් අවුත් මළු හැමඳ පැන් පරහා තුබූ ය"යි නො කියව. එබන්දෙක් ඇසිණි නම් බුදුන්ගෙන් අප ලත් ප්‍රසංසාවට ඒ පිටි පෑ තිබෙයි. මෙවක් පටන් වත් පිළිවෙත් තබා මේ දසාවෙත් නො එව'යි වදළ සේක. එසේ වදළත් දේවතා දුවණියෝ තමන්ට සිද්ධ වන කුශලය මුත් ඔබට වන්නා වූ අසාරුප්පය සැදෑ වේගයෙන් සලකාගත නොහී තවත් නොගොස් සිටිත් ම ය. මහ තෙරුන් වහන්සේ ද 'මෝ අප කියතත් සිටීම ය'යි කිපි ලෙසක් මෙන් 'තීගේ තරම් නොදන්නී ද'යි වදරාලා අසුර ගසා ලූ සේක. උෟ එවේලෙහි එතැන රඳා සිටිය නොහී අහසට පැන නැඟී ලා දෝත් මුදුනේ තබාගෙන, 'ස්වාමීනි, මා ලත් සැපත තර කොටගත දුන මැනව'යි කියකියා හඬමින් වලපමින් අහස සිටියහ.

බුදුහු රජගහ නුවරට එක්සිය අසූ ගවුවක් විතර තිබෙන දෙව්රම ගඳකිළියේ වැඩහිඳ ම දෙව් දුවණියන් හඬන හඬ අසා රස් කඳක් විහිදුවා එතැන වැඩහුන්නාක් මෙන් පැලා 'හෙම්බා දෙව්දුව, මපුත් මහසුප් මහ තෙරුන්ට තෙල ලෙස කරන දෙය අසරුප් බැවින් නැවතීම යහපත. පින් කරනු කැමැත්තවුන්ට තවත් තවත් පින් ඇති බැවින් "අපට ප්‍රයෝජන නම් මෙ ම වේ ද"යි සලකා පින් කිරීම වළක්ව වළක්වාත් කන බතින් බඩ පිරෙන්නා සේ යහපතැ'යි වදරා 'හෙම්බල දේවතාදුව, පින් කරන කල නම් "එක් වරෙක පින් කෙළෙමි. එතෙක් මට සෑහෙයි. ඒ පින්කම නොපසුබැස වඩවඩා පින් කළමනා ය. පින්කම් කරනට ඉදින් විභව නැත් නමුත් කවර විටෙක දෝ පින්කමක් කොට ගන්නේ යැයි හැම වෙලේ ම උත්සාහ කළ යුතු ය . කුමක් නිසා ද යත් - කිරීමෙන් වුවත් සිතීමෙන් වුවත් කුසලය ඊ ස්කිරීම මෙලෝ පරලෝ දෙකට ම යහපත. ඒ හෙයිනැයි වදළ සේක. දේශනා කෙළවර දෙව් දුවණියෝ එක්සිය අසූ ගවුවකින් ඈත සිටියෝත් සෝවාන් ව ලොවී සැපත් කුම් වුවත් අනුපධිශෙෂ නිර්වාණධාතුව දක්වා තිබෙන හෙයින් ලොවුතුරා සම්පත් තරකොට සසර දුක් අත්හළහ.

### අරුත් පැහැදිලි කිරීම්

| | |
|---|---|
| අටසාලිස් | - හතළිස් අටක් |
| අනුසසින් | - ආනිසංසයෙන් |
| අසාරුප්පය | - නොගැළපෙන |
| ඔබට වන්නා වූ | - උන් වහන්සේට සිදුවන |
| තුන් කෙළ සැට ලක්ෂයක් | - තුන්කෝටි සැට ලක්ෂයක් |
| පසඟ පිහිටුවා | - නළල, දෙවැලමිට හා දෙදණ බිම ස්පර්ශ වන සේ තබා |
| පහන් සිතැති ව | - ප්‍රසන්න වූ සිතින් / පැහැදුණු සිතකින් |
| රකවල් පළට | - හේන් රැකීම සඳහා ඉදි කළ පැලට |
| විෂ වේගයෙන් | - විෂ බලවත් බවින් |

## ක්‍රියාකාරකම 01

01. මේ කථාව කියවීමෙන් ලබා ගත හැකි ආදර්ශය කුමක් ද?
02. පහත උද්ධෘතවල අවස්ථා සම්බන්ධය දක්වන්න.

   i. "ලසු කුසලයෙන් මේසා මහත් සම්පතක් ලදින් මේ දෙව්ලොව තුන් කෙළ සැටලක්ෂයක් හවුරුදු පමණ නො ව, සසර ඉතා දික් ව තිබෙන හෙයින් පමා වීම නපුර"
   ii. "තොප කළ පින් රකවල්පළට වදනා තරම් ද? දෙව්ලොව රන් විමන්වලට එව"
   iii. "තීගේ තරම නොදන්නී ද ?
   iv. "එක් වරෙක පින් කළෙමි. එතෙක් මට සෑහෙයි"

## ක්‍රියාකාරකම 02

01. පහත සඳහන් උපමාවල අරුත් පහදන්න.
   i. විළඳ ඇට බැඳී සැහැල්ලු වූවා සේ ම
   ii. නිදා පුබුත් කෙනෙකුන් මෙන්
   iii. හකුළුවා ලූ කලට තුඹ සා මලක්
   iv. උගත් ග්‍රන්ථයක් ප්‍රගුණ කොට තර කරන්නා සේ
   v. කැඳවා ආ මේවර කරන්නකු වැනි

## ක්‍රියාකාරකම 03

මේ පාඩමෙහි හැල්කරල්, දෙව්සැප, තුන්ගව්වක්, වෙහෙරමළු, වත්පිළිවෙත්, අස්ථිර වැනි සමාස පද හමු වේ.

භාෂා භාවිතයේ දී කෙටි කර දක්විය හැකි පද - එනම් සමාස පද - දක්නට ලැබේ. වෙන් වූ අර්ථ ඇති පද එක අර්ථයක් ප්‍රකාශ වන සේ ගැළපීම සමාස කිරීම නම් වේ. සමාස පද සෑදීමේ දී

01. සම්බන්ධ කිරීමට සුදුසු අර්ථයන්ගෙන් යුක්ත වීම,
02. විභක්ති ප්‍රත්‍යය හා නිපාත ලොප් වීම,
03. අර්ථය හා පද සංක්ෂිප්ත වීම යන ලක්ෂණ දැකිය හැකි ය.

**සමාස ප්‍රභේද කීපයකි. එනම්**

- **අව්‍යය සමාසය**
- **දකාරාර්ථ සමාසය**
- **විශේෂණ සමාසය**
- **අන්‍යාර්ථ සමාසය**
- **විභක්ති සමාසය**

### ■ අව්‍යය සමාසය

මේ වාක්‍යය දෙස බලන්න.
කුසලයෙහි හැසිර **අස්ථිර** වූ සැප හැර ස්ථිර වූ නිවන් සැප සාදා ගත යුතු ය.

"දෙගුරුන් විසින් තම දරුවන්ට දෙන **නොමඳ** දන නම් සිල්ප මැ යි''
"**නිදොස්** කෙනකු මෙදියත උපදනේ නැත''

| | | | | |
|---|---|---|---|---|
| අ | + | ස්ථිර | - | අස්ථිර |
| නො | + | මඳ | - | නොමඳ |
| නි | + | දොස් | - | නිදොස් |

ඉහත දැක්වෙන වාක්‍යයන්හි 'අ' 'නො' 'නි' ආදි පද අව්‍යය පදයි. අව්‍යය පද යනු වර විභක්ති ප්‍රත්‍ය ගන්වා අරුත් නොදෙන නිපාත හා උපසර්ග වේ. අව්‍යය පද මුලට යෙදී සංක්ෂිප්ත වීම අව්‍යය සමාස නම් වේ.

පහත දැක්වෙන උදාහරණ ද බලා අවබෝධ කර ගන්න.

| | | | | |
|---|---|---|---|---|
| අව | + | මඟුල් | - | අවමඟුල් |
| අනු | + | බල | - | අනුබල |
| නො | + | වියත් | - | නොවියත් |

■ දකාරාර්ථ සමාසය

දෙව් දියණියෝ <u>වත්පිළිවෙත්</u> එලෙස ම කළහ.
<u>ඉරහඳ</u> පවතින තුරු මේ නියමය පැවතිය යුතු ය.
<u>ඇළදොළ</u> උතුරුවා යන තරම් වූ මහ වැසි ඇද වැටුණේ ය.

මේ වාක්‍යවල ඉරි ඇඳි පද සැදී ඇති අයුරු විභාග කර බලමු.

උදාහරණ:

වත් ද පිළිවෙත් ද - වත්පිළිවෙත්
ඉර ද හඳ ද - ඉරහඳ
ඇළ ද දොළ ද - ඇළදොළ

මෙහි 'ද' නිපාතයෙන් සම්බන්ධ වූ පද එම නිපාතය ඉවත් කොට ගැළපීමෙන් දකාරාර්ථ සමාසය සැදේ. 'ත් ' සහ 'යි ' යන නිපාත ද දකාරාර්ථ සමාසය සකස් වීමේ දී යෙදේ.

උදාහරණ:

ගසුත් වැලුත් - ගස්වැල්
නළුවොයි නිළියොයි - නළුනිළියෝ

**පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පද අයත් වන සමාස වර්ගය නම් කරන්න.**

i. <u>ගායක ගායිකාවෝ</u> වේදිකාව මතට පැමිණියහ.
ii. <u>අකුසල්</u> කර අපාගත නොවන්න.
iii. <u>තරුණ තරුණියෝ</u> උදැසන ම පැමිණ ශ්‍රමදානයට සහභාගි වූහ.
iv. විවිධ ප්‍රසංගයෙහි <u>ගී නැටුම්</u> බොහෝ විය.
v. <u>නොමිහිරි</u> ද මේ වෙණ
vi. <u>ඇසූහු</u> ද මෙයින් වැඩි වෙණ

**පහත සඳහන් පද සමාස පද සේ සකස් කර වාක්‍යය බැගින් ලියන්න.**

i. මනා වූ සිරිත්
ii. ගුරු ද දෙගුරු ද
iii. සත් පුරුෂ නො වූ
iv. තෙලුත් මලුත් පහනුත්
v. සත්‍ය නො වූ

## ක්‍රියාකාරකම 04

01. මේ කථා වස්තුව සාවධාන ව කියවන්න.

02. මේ කථා වස්තුව ශබ්ද නගා කියවන්න.

03. ලද දෙව්දුව සහ මහා කාශ්‍යප මහරහතන් වහන්සේ අතර ඇති වූ දෙබස ඔබේ වචනයෙන් ලියන්න.

04. සමාජයේ ජීවත් වීමේ දී ලද දෙව්දුවගේ වස්තුවෙන් කියැවෙන ප්‍රධාන අදහස කොතරම් දුරට වැදගත් වේ දැයි පැහැදිලි කරමින් පන්තිය ඉදිරියේ කථාවක් කරන්න.

05 සිංහල සාහිත්‍ය සමිතිය ඉදිරියේ ඔබ කැමති ජාතක කථාවක් ශ්‍රැතිගෝචර ශෛලියෙන් ඉදිරිපත් කරන්න.

### පැවරුම්

සද්ධර්මරත්නාවලිය හැර වෙනත් සිංහල බණ පොත් තෝරාගෙන ඒවායේ කතුවරුන්, රචිත කාලය හා වස්තු විෂය පිළිබඳ තොරතුරු ඇතුළත් කොට පොත් පිංචක් සකස් කරන්න.